# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 417 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 09/03/2024
පැය 2115

**මාධ්‍ය නිවේදනය**

**රගර් තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.**

ශ්‍රී ලංකා රගර් සම්මේලනය විසින් සංවිධානය කරනු ලැබූ **"2024 ක්ලිෆර්ඩ් අභියෝගතා කුසලාන පිළිමලුන් පිටු දැකීමේ රගර් තරඟාවලිය"** අවසන් මහා තරඟය පොලිස් රගර් කණ්ඩායම හා හැව්ලොක් කණ්ඩායම අතර 2024.03.09 වන අද දින කොළඹ තුරග තරඟ පිටියේදී පැවැත්විණි. මෙම තරඟාවලිය සඳහා ප්‍රධාන පෙළේ රගර් ක්‍රීඩා කණ්ඩායම් 07 ක් සහභාගී විය.

තරඟාවලියේ අවසාන මහා තරඟයේදී හැව්ලොක් කණ්ඩායම පරාජය කරමින් පොලිස් රගර් කණ්ඩායම උත්සාහක දිනුම් 03 ක් සමඟ ලකුණු 19 ට 12 ක් වශයෙන් තරඟය ජයග්‍රහණය කර ක්ලිෆර්ඩ් අභියෝගතා කුසලානය වසර 33 කට පසු දිනා ගන්නා ලදී.

මෙම අවසන් මහා තරඟයේ ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා ක්‍රීඩා අමාත්‍ය ගරු හරීන් ප්‍රනාන්දු මැතිතුමා සහ ගරු පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සහභාගී විය.

පොලිස් රගර් කණ්ඩායමේ සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රන්මල් කොඩිතුවක්කු මහතා, ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිෂාම් ජමාල්ඩීන් මහතා, කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු ලෙස නිලුෆ ඉබ්‍රහීම් මහතා, කළමණාකරු ලෙස පොලිස් පරීක්ෂක එස්.එම්.එස් සමරකෝන් මහතා හා කණ්ඩායමේ නායකයා ලෙස උප පොලිස් පරීක්ෂක මොහාන් විමලරත්න යන මහත්වරුන් කටයුතු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**